- permanent membersලාගේ - මූලිකත්වයෙන් වහාම එහි කැඳවීමක් කරලා, ඔවුන්ගේ මැදිහත්වීමෙන් ඒ ජන සංහාරය - ඒ මිනිස් ඝාතනය - නතර කරන්න, එහෙම නැත්නම් ඒ ත්‍රස්තවාදය සහ රාජ්‍ය ත්‍රස්තවාදය කියන දෙක වහාම නතර කරන්න අපි යෝජනා කරමු කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Madhura Withanage to the Chair?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
Sir, I propose that the Hon. Madhura Withanage do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு மதுர விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. MADHURA WITHANAGE took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ක්‍රමය ගැන කථා කරපු වෙලාවේ ගරු අග්‍රාමාත්‍යතුමාත්, අමාත්‍යවරුනුත් මේ ගරු සභාවේ ඉදිරිපත් කරපු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. ගරු අගමැතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමනි, සද්භාවයෙන් ක්‍රියාත්මක කරන ඕනෑම ක්‍රියාදාමයකට සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. ඒ වාගේම මම ඔබතුමන්ලාටත්, මේ රටේ මහජනතාවටත් ආරාධනා කරනවා, "Manthri.lk" වෙබ් අඩවියට පිවිසිලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සද්භාවයෙන් අත් ඔසවපු කණ්ඩායම කවුද කියන එක බලන්න කියලා. ඔවුන් ඒ ඔක්කෝටම අත් ඔසවලා එකඟවෙලා තිබෙනවා. සද්භාවයෙන් කිව්වාම, වචනයේ පරිසමාප්තයෙන්ම එය විය යුතුයි. "Manthri.lk" වෙබ් අඩවියට පිවිසිලා බලා ගන්න පුළුවන් සද්භාවයෙන් හැම එකටම අත ඔසවපු අය කවුද කියලා.

ඊළඟට, මම කියන්න කැමතියි, මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් ජනවරමකින් පස්සේ සිදු කරන්න කියලා. ජනතාව ඡන්දය ප්‍රකාශ කළාට පස්සේ, ඒ කියන්නේ මැතිවරණයකින් පස්සේ අපි ඒ ටික කරමු. තුන්වැනි කාරණාව තමයි ගරු අගමැතිතුමා බොහොම බරපතළ ප්‍රකාශයක් කළා. ඒ තමයි එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට විපක්ෂයේ මන්ත්‍රීවරු ඇවිල්ලා මැතිවරණය කල් දමන්න හෝ මැතිවරණය නතර කරන්න කියලා ප්‍රකාශ කළාය කියන කාරණය. ගරු අගමැතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ උපදේශක කාරක සභාවේ කාර්යය සටහන් සහ එසේ යෝජනා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නම් ගරු සභාවේ සභාගත කරන්න කියලා. ඒක කරන්න. අපටත් දැන ගන්න ඕනෑ, විපක්ෂයේ මොන මන්ත්‍රීවරයාද පළාත් පාලන මැතිවරණය කල් දමන්න, එහෙම නැත්නම් පළාත් පාලන මැතිවරණය නතර කරන්න කිව්වේ කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම නම් කථා කළේ මන්ත්‍රීවරුන් මෙතැනට ඇවිල්ලා වරප්‍රසාද ප්‍රශ්න යටතේ අධිකරණයේ විනිසුරුවන්ට සහ මැතිවරණ නිලධාරින්ට තර්ජන, ගර්ජන එල්ල කරමින් ඉදිරිපත් කළ කාරණාව ගැන. එක එක්කෙනා ඇවිල්ලා ඒ තොප්පිය දමා ගන්නවා. මට ඒකට කරන්න දෙයක් නැහැ. මම කථා කළේ නැහැ, තරුණ නියෝජනත්වය ගැන. නමුත් ඇත්තවශයෙන්ම තරුණ නියෝජනත්වය අත්‍යවශ්‍යයි. අපි විශ්වාස කරනවා, ඒ අඩු පාඩුවත් නිවැරදි වෙන්නට ඕනෑ කියා. අපි ඒ නිවැරදි ක්‍රියා මාර්ගයට උදවු කරන්න සූදානම්. හැබැයි, ඔය හැම දේම අපි කරමු, මැතිවරණයකින් පසුව.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විදුලි ගාස්තු තුන්වන වරටත් සංශෝධනය සඳහා කර ඇති ඉල්ලීම
### மூன்றாவது முறையாகவும் மின் கட்டணத்தை மீள்திருத்தம் செய்வதற்கான கோரிக்கை
### REQUEST TO REVISE ELECTRICITY TARIFF FOR THE THIRD TIME

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි බිල පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇතිවී තිබෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් යළිත් වරක් විදුලි ගාස්තුව ඉහළ නැංවීම සඳහා මහජන උපයෝගිතා කොමිසමෙන් ඉල්ලීමක් සිදු කර ඇති බව වාර්තා වෙනවා. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නිකුත් කර ඇති රජයේ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ ප්‍රකාරව වසරකට දෙවරක් පමණක් විදුලි ගාස්තුව සංශෝධනයට කටයුතු කරනු ලබන බවට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇතත්, එම ප්‍රතිපත්තියට පටහැනිව යමින් තෙවන වරටත් විදුලි ගාස්තුව වැඩි කිරීම සඳහා රජය පිඹුරුපත් සකස් කරමින් සිටිනවාය කියන එක අපට ආරංචි වෙනවා. මේ නිසා ජනතාව පත් වන අසීරු තත්ත්වය ගැන රජය කිසිදු ආකාරයකින් සංවේදී නොවීම කනගාටුදායක කාරණාවක්.

2023.01.10 දිනැති කැබිනට් පත්‍රිකාවේ මෙසේ සඳහන් වෙනවා:

> "…to review, update and revise the electricity tariff biannually in future in terms of the revised General Policy Guidelines as per the decision.."

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කැබිනට් පත්‍රිකාවේ පිටපත මම **සභාගත*** කරනවා.

රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ වසරකට දෙවරක් පමණක් විදුලි ගාස්තුව සංශෝධනය කිරීමයි. ඒ නිසා මෙය ජාතික වැදගත්කමකින් යුත් ගැටලුවක් හැටියට සලකා මම මේ ප්‍රශ්න ටික ඉදිරිපත් කරනවා.

01. රජය යළිත් වරක් විදුලි බිල ඉහළ නැංවීම සඳහා තීරණයක් ගෙන තිබේද? ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී තිබේද? ලංකා විදුලිබල මණ්ඩලය විසින් කොපමණ ප්‍රතිශතයකින් විදුලි බිල වැඩි කිරීමට ඉල්ලීම් සිදු කර තිබේද? ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති හේතු මොනවාද?

රජය සමස්තයක් ලෙස කොපමණ ප්‍රතිශතයකින් විදුලි බිල වැඩි කිරීමට අපේක්ෂා කරන්නේද? පාවිච්චි කරන ඒකක මට්ටමින් ඒ තොරතුරු ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

වත්මන් මිලට සාපේක්ෂව ගෘහස්ථ, ව්‍යාපාරික හා අනෙකුත් අය ක්‍රමවල එක් එක් කාණ්ඩවල මිල වැඩිවීමක් සිදු වන්නේ නම් ඒ කවර ප්‍රතිශතවලින්ද? රජය මෙම විදුලි බිල වැඩිවීම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නේ කවදා සිට ද?

02. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නිකුත් කර ඇති රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ප්‍රකාරව විදුලි බිල වැඩි කිරීම සිදු කරනු ලබන්නේ වසරකට දෙවරක් පමණක් බවට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබුණා. එසේ තිබියදී තෙවන වරටත් ජනතාව මත බර පටවමින් මෙලෙස විදුලි බිල ඉහළ නංවනු ලබන්නේ ඇයි? එය රජයේ ප්‍රතිපත්තියට පටහැනි නොවන්නේද? රජය වරින් වර ප්‍රතිපත්තිමය තීරණ වෙනස් කරනු ලබන්නේ කුමන බලපෑමක් මතද? මේ නිසා ජනතාවට සිදුවන දැඩි පීඩාව සම්බන්ධයෙන් රජය මේ තරම් අසංවේදී වන්නේ මන්ද?

03. මෙම වසරේ දෙවරක් විදුලි ගාස්තුව සංශෝධනයෙන් පසුවත් තවදුරටත් ලංකා විදුලිබල මණ්ඩලය අලාභ ලබන තත්ත්වයකින් පසුවන්නේද? එසේ නම්, මෙම වසරේදී තවත් කොපමණ ප්‍රමාණයක අලාභයක් හිමි වේ යැයි ඇස්තමේන්තු කර තිබේද? ලංකා විදුලිබල මණ්ඩලය ලබන සියලු අලාභ ජනතාවගෙන් පියවා ගැනීමට රජය අපේක්ෂා කරන්නේද? නැතහොත් අලාභ පියවා ගැනීම සඳහා රජය සතු වෙනත් විකල්ප විසඳුම් කවරේද?

විදුලි බිල නොගෙවූ අයගෙන් ඒ විදුලි බිල අය කර ගැනීමේ ක්‍රම අනුගමනය කිරීම උදාහරණයක් හැටියට ගන්න පුළුවන්.

04. රජය මෙම වසරේ සමස්ත විදුලි ඉල්ලුමෙන් කොපමණ ප්‍රමාණයක් ජල විදුලිය මගින් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේද? එම අපේක්ෂිත ප්‍රමාණයෙන් ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීමට හැකි වූයේද? නොඑසේ නම්, ඊට හේතු කවරේද? රජය වාර්ෂිකව කොපමණ විදුලි ඒකක ප්‍රමාණයක් ජලය මගින් සිදු කළ යුතු බවට නිසි තක්සේරුවක් කර තිබේද? ඒ සඳහා ස්වාධීන කමිටුවක් මගින් අධ්‍යයනයක් සිදු කර තිබේද? එසේ නම්, එම අධ්‍යයන වාර්තාව සභාගත කරන්නේද? සැලකිය යුතු වර්ෂාපතනයක් හිමි වන කාල පරිච්ඡේදයේදී නිසි ජල කළමනාකරණයක් සිදු කිරීම තුළින් විදුලි ජනන පිරිවැය අවම කර ගත නොහැකිද? සෑම විටම විදුලි උත්පාදනය සිදු කරනු ලබන්නේ අඩු පිරිවැය මත පදනම්ව - merit order based - බවට රජයට සහතික වන්න පුළුවන්ද?

5. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ තුන්වැනි විදුලි ජනන ඒකකය සැලසුම් සහගත නඩත්තුවෙන් අනතුරුව නොවැම්බර් මාසයේදී යළි පණ ගැන්වීමට රජය කටයුතු කරන්නේ ද? එම විදුලි ජනන ඒකකය යළි පණ ගැන්වීම සඳහා දැනට සිටින මෙහෙයුම් ඉංජිනේරුවන් ප්‍රමාණවත් නොවන බව වාර්තා වේ. මෙය සත්‍යයක් ද? එසේ නම්, එම තත්ත්වය නිරාකරණය කිරීමට රජය ගෙන ඇති පියවර මොනවාද? මෙම තුන්වැනි විදුලි ජනන ඒකකය නිසි කලට යළි පණ ගැන්වීමට නොහැකි වුවහොත් එමගින් රජයට සිදුවන පාඩුව කොපමණ ද?

6. රජය පසුගිය කාලයේදී විදුලිය හදිසි මිලදී ගැනීම් සිදු කර ඇති බව වාර්තා විය. පසුගිය කාලයේදී රජය කොපමණ වතාවක් විදුලිය හදිසි මිලදී ගැනීම් සිදු කළේ ද? එහිදී එක් ඒකකයක් කොපමණ මිලකට ලබා ගත්තේ ද? ඒ සඳහා වැය වුණු සමස්ත පිරිවැය කොපමණ ද? ඉදිරියේදීත් රජය මෙවැනි හදිසි මිලදී ගැනීම් කිරීමට බලාපොරොත්තු වන්නේ ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරක් බලාපොරොත්තුවෙන් මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ස්තුතියි.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)

(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉදිරියේදී මේ සඳහා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙනවා. විපක්ෂ නායකතුමා අසා තිබෙන ප්‍රශ්න වෙනුවෙන් එකතු කරගන්න තොරතුරු ගණනාවක් තිබෙනවා. ඒ තොරතුරු එකතු කරගෙන පිළිතුර ලබා දෙන්න මා කටයුතු කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ස්ථාවර නියෝග 27(2) යටතේ දෙවන ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**

(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)

(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට ප්‍රථම, ලෝකයේ අද ඇතිවී තිබෙන ව්‍යසනකාරී යුද වාතාවරණය පිළිබඳව මා විශේෂයෙන්ම අදහසක් පළ කළ යුතු වෙනවා. විපක්ෂ නායකතුමාත් ඒ සම්බන්ධයෙන් දැන් අදහසක් පළ කරනු ලැබුවා. ඇත්ත වශයෙන්ම ගාසා තීරයේත්, මැද පෙරදිග කලාපයේ යම් යම් තැන්වලත් සිදුවන යුද්ධය නිසා දරුවන්, ගැබිනි මව්වරුන් විශාල වශයෙන් මිය යනවා. විශේෂයෙන්ම මේ යුද ගැටුම් නිසා ඒ සෑම පුරවැසියෙක්ම අද විශාල ඛේදවාචකයකට ලක්වෙලා තිබෙනවා. මෙවැනි අවස්ථාවකදී ලෝකයේ බලගතු රාජ්‍යයන් ඇතුළු සෑම පාර්ශ්වයක්ම එකතු වෙලා, යුද්ධය තාවකාලිකව නතරකොට යම්කිසි සාකච්ඡාවකට එළඹීමට බලපෑම් කළ යුතුව තිබුණත්, අද

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*